# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1997 අංක 38 දරන ජාතිය රැක ගැනීමේ දායක මුදල් (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 1997 දෙසැම්බර් මස 23 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

1997 දෙසැම්බර් මස 26 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

**මිල : රු. 3.50 යි.** **තැපැල් ගාස්තුව : රු. 2.50 යි.**

**1997 අංක 38 දරන ජාතිය රැක ගැනීමේ දායක මුදල් (සංශෝධන) පනත**

[සහතිකය සටහන් කළේ 1997 දෙසැම්බර් මස 23 වන දින]

එල්. ඩී.–ඕ. 38/97.

**1996 අංක 5 දරන ජාතිය රැක ගැනීමේ දායක මුදල් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :-

1\. මේ පනත 1997 අංක 38 දරන ජාතිය රැක ගැනීමේ දායක මුදල් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ලුහුඬු නාමය.

2\. (මෙහි මින් මතු " ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1996 අංක 5 දරන ජාතිය රැක ගැනීමේ දායක මුදල් පනතේ දීර්ඝ නාමයෙහි යෙදෙන " පිළිවෙලින් 1996 අප්‍රේල් මස 1 වන දිනයෙන් සහ 1997 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන වර්ෂවල සෑම කාර්තුවක් සඳහා ම" යන වචන හා ඉලක්කම් වෙනුවට "1996 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන වර්ෂයේ සෑම කාර්තුවක් සඳහා ම සහ 1997 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසු ආරම්භ වන සෑම වර්ෂයක ම සෑම කාර්තුවක් සඳහා ම" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ දීර්ඝ නාමය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

1996 අංක 5 දරන පනතේ දීර්ඝ නාමය සංශෝධනය කිරීම.

3\. ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තියේ (1) වන උපවගන්තියෙහි යෙදෙන"පිළිවෙලින් 1996 අප්‍රේල් මස 1 වන දිනයෙන් සහ 1997 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන වර්ෂවල" යන වචන හා ඉලක්කම් වෙනුවට "1996 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන වර්ෂයේ හා 1997 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසු ආරම්භ වන සෑම වර්ෂයක ම" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.

4\. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.